**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය - සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය**

**පුරප්පාඩු**

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට අනුබද්ධව ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව සඳහා සුදුසුකම් සහිත පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>ව්‍යාපෘති නිලධාරි (මූල්‍ය)</u>**

**තනතුරු සංඛ්‍යාව** - 01

**වැටුප් කේතය** - PS 06 - A (01/2019 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය පරිදි)

**මාසික වැටුප** - PS 06 - A (රු. 64,000.00 + රජයේ අනුමත වෙනත් දීමනා)

**සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණය/ ගණකාධිකරණය/ වාණිජ්‍ය පිළිබඳ උපාධියක් ලබා තිබීම

   හෝ

   උක්ත විෂය ක්ෂේත්‍රයේ උපාධියකට සමානයැයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

   හෝ

   උක්ත ක්ෂේත්‍රයට අදාළ පිළිගත් වෘත්තීය ආයතනයකින් පිරිනමනු ලබන ආශ්‍රිත සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම

   හෝ

   ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

   සහ

   අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි අවුරුදු 03ක සේවා පළපුරුද්දක් තිබීම

2. ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

   සහ

   අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි අවුරුදු 08ක සේවා පළපුරුද්දක් තිබීම

3. ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

   සහ

   අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි අවුරුදු 13ක සේවා පළපුරුද්දක් තිබීම

**සැ.යු. :** ඉහත තොරතුරුවලට අදාළ සුදුසුකම් සහ Terms of Reference (තාවකාලික) පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් ලබාගත හැක.

https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov.lk/web/si/jobs

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**
මූලික සුදුසුකම් සහ පලපුරුද්ද සපුරා ඇති කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**බඳවාගැනීමේ පදනම :**
බාහිර අයදුම්කරුවකු තෝරා පත්වුවහොත් අදාළ තනතුරට ඔහු/ඇය කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලබන අතර රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකු තෝරා ගනු ලැබුව හොත් ඔහු/ඇය ද්විතීයන පදනම මත බඳවා ගනු ලැබේ.

**නියමයන් හා කොන්දේසි :**
මෙම පත්වීම මූලිකව, එක් වසරක කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා අතර, කාර්ය සාධනය ඇගයීමෙන් පසුව සතුටුදායක සේවයක් කර තිබේනම්, උපරිම වර්ෂ 03ක් දක්වා වාර්ෂිකව නැවත පත්වීම අළුත් කිරීම සලකා බැලේ. උක්ත පත්කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 01/2019 චක්‍රලේඛයේ විධිවිධාන හා ඒ හා සම්බන්ධ හෝ විටින් විට නිකුත් කර ඇති වෙනත් චක්‍රලේඛවල විධිවිධාන ද අදාළ වේ.

ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.
https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov.lk/web/si/jobs

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.05.21 දින හෝ එදිනට පෙර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො. 191, ධර්මපාල මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් එවිය යුතුය. රජයේ / සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතනය වල ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. පමා වූ, අසම්පූර්ණ හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තවද, අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය සේ සැලකිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය,**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය,**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**කොළඹ 01**